12 (1)


# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2023 . 03 . 21 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : පී.බී.කේ. ගුණසේකර මයා.
416. ධම්මරතන මාවත.
හොරණ.

වගඋත්තර පාර්ශවය : 01 ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්.
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත.
කොළඹ 07.

02 මූලස්ථාන පොලිස් පරික්ෂක.
පොලිස් ස්ථානය.
හොරණ.

03 ගොවිජන සංවර්ධන නිලධාරිණී.
ආර්.කේ.එම්.කේ.කරුණාතිලක මිය.
ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය.
කතන්විල. හොරණ.

පැමිණිලි අංකය : HRC/1140/12

පැමිණිල්ලේ කරුණු දැක්වීම =:

ඉහත පැමිණිලිකාරිය විසින් 2012-03-14 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ල සහ පසුව ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ. තමාට අයත් පර්චස් 20.75 ක ඉඩමේ නිවසක් ඉදි කිරීමට යාමේදී ඉහත සදහන් වගඋත්තරකාර පාර්ශවයන්ගේ මැදිහත්වීම මත එම කටයුත්ත නතර කිරීමට සිදුවූ බවත්, ඒ හේතුවෙන් තමාට අයත් ඉඩමේ නීත්‍යානුකූල ලෙස නිවසක් ඉදි කර ගැනීමට තිබූ අවස්ථාව ඉහත රජයේ නිලධාරීන්ගේ අනීතික




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මැදිහත්වීම හේතුවෙන් සිදු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්, ඒ සම්බන්ධව විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම =:**

මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු සඳහන් කරන ඉඩම ගොවිජන සේවා කුඹුරු නාම ලේඛනයේ ලියාපදිංචි ඉඩමක් බවට ලියාපදිංචිව ඇති බවත්, එබැවින් කුඹුරු ඉඩම් ගොඩ කර නිවාස හෝ වෙනත් ඉදි කිරීම් සිදු කිරීමට අවස්ථාව ලබා දිය නොහැකි බවත්ය.

තවද මෙම පැමිණිල්ලට අදාලව පරීක්ෂණ වලට කැඳවා තිබියදී ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව එවකට ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමෙන් පසුව දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රතිචාර දැක්වීමක් සිදු කර ඇත. එම දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගතය පරිදි ගල්ගහලියද්ද සහ හොන්ඩාවල කුඹුරු ඉඩම අනවසරයෙන් පස් පුරවා ගොඩ කර නිවසක් ඉදිකිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු වගඋත්තරකරු ලෙස නම් කර 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 32 වන වගන්තිය යටතේ හොරණ මහේස්ත්‍රාත් අධිකරණයේ 74701 අංකය යටතේ නඩුව විභාග වෙමින් පවතින බවද ප්‍රකාශ කර ඇත.

තවද ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව එම දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් කලුතර විසින් පවරා ඇති මෙම නඩුවේ චූදිත වන පැමිණිලිකරු විසින් සිදු කළයුතු වන්නේ පැමිණිල්ලට එරෙහිව කරුණු දක්වමින් තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීම බවත්, තම නිලධාරීන් මෙහිදී නීතියට අනුකූලව කටයුතු කර ඇති බවත්, කොමසාරිස් ජනරාල්වරයා සඳහන් කර ඇත. එසේම කුඹුරු ඉඩම වෙනත් කාර්යයන් සඳහා හෝ කුඹුරු ඉඩමක් නොවන බවට සහතික ලබාදීමේ එකම බලධරයා ගොවිජන සංවර්ධන කොමසාරිස් වන තමා බව කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් දන්වා ඇත.

**විමර්ශනය :-**

මෙම තත්වය මත ඉහත සඳහන් නඩුවේ තීන්දුව ලබා දෙන තෙක් ගොනුව බහා තබා ඇති අතර, 2022-08-21 දිනැතිව හොරණ මහේස්ත්‍රාත් අධිකරණයේදී චන්දන කලංසූරිය මහේස්ත්‍රාත්වරයා විසින් අදාළ නඩු තීන්දුව ලබාදී ඇත. එහිදී චූදිත පැමිණිලිකරු නිදොස් කොට නිදහස් කරමින් මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලි පාර්ශවය වන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින්ම මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත ඉඩම, 'කුඹුරු ඉඩමක් නොව ගොඩ ඉඩමක්' බවට ලිඛිතව වසර ගණනාවකට පෙර නිකුත් කර ඇති ලේඛන මත පදනම්ව සැලකීමේදී පැහැදිලිව පිළිගෙන ඇති බවයි. ඒ අනුව පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කරමින්

වගඋත්තරකරුවන් විසින් තම මූලික අයිතිවාසිකම් කඩ කරමින් කටයුතු කරමින් සිටින බවට ඉදිරිපත් කර ඇති චෝදනා සනාථ වන බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කාරණා අනුව විශේෂයෙන්ම වගඋත්තරකාර පාර්ශවය වන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් ඇතුළු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් කළුතර සහ ගොවිජන සංවර්ධන කාර්යාලය, කනංවිල, හොරණ කාර්යාලයේ නිලධාරීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලි පාර්ශවය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් හිමිකර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බැවින්, වසර 10 කට වැඩි කාලයක් පැමිණිලිකරු හට තම ඉඩමේ නිවසක් ඉදි කර ගැනීමට බාධා සිදු කරමින් ඔහුට එරෙහිව අධිකරණයේ නඩුවක් පවත්වාගෙන යෑම මගින් සිදු කර ඇති අගතිය වෙනුවෙන් ගොවිජන සේවා කොමසාරිස් ඇතුළු ඉහත වගඋත්තරකරුවන් විසින් රු.15,000/- ක වන්දි මුදල් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 04. 28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/